මුහුණට මුහුණ

# මෙල්බන් ශ්‍රී ලාංකේය කණ්ඩායම් සංගීතයේ පුරෝගාමියා - දයා සිල්වා

## වසර 40 ක් පෙරමුණේ

ශ්‍රීනාත් මද්දුමගේ



මෙල්බන් හි ශ්‍රී ලාංකේය සංගීත කණ්ඩායම් පිළිබඳව කතා කරන විට ඔහුගේ නම අපට මග හැර යා නොහැකි ය. ඔහු මේ නවීන තාක්ෂණයේ සංගීතය බිහිවන්නටත් පෙර සිටම සංගීත ක්ෂේත්‍රයේ දස්කම් දැක්වූ සංගීතඥයෙකි. ශ්‍රී ලංකාවේ දී ආරම්භ කළ සිය සංගීත දිවිය මෙල්බනය දක්වාම නොකඩවා පවත්වා ගෙන යන" අද අපේ කතා බහට එක්වන" මේ දක්ෂ සංගීතඥයා දයා සිල්වා මහතා යි.

ශ්‍රීනාත්
ඔබේ සංගීත දිවියේ ආරම්භය ගැන කතා කරමුද?
දයා
ඔව්. මම සංගීත ක්ෂෙත්‍රයට ආවෙ අද ඊයෙක නෙවෙයි. මේ වන විට මගේ සංගීත දිවියට අවුරුදු 40 ක් පිරිලා තිබෙනවා. මම මුලින්ම 1969 දී ලංකාවේ තරංගා නමින් සංගීත කණ්ඩායමක් ආරම්භ කළා. ඒ කාලයේදී බොහොම ජනප්‍රිය සංගීත කණ්ඩායම් බිහිවුණ යුගයක්. ඒ කාලයේ අපේ සංගීත කණ්ඩායම ත් ඉතා ඉහළ දස්කම් දැක්වූවා.

මගේ පළමුවෙනි ගීතය පටිගත කළේ 1969 දී. ඒ කාලය වන විට නවීන ශබ්දාගාර පවා බිහිවෙලා තිබුණෙ නැහැ. ඒ ගීතය රචනා කළේ රේඩියෝ සිලෝන් ඒකේ සේවය කළ කෙනෙක්.

ශ්‍රීනාත්
රේඩියෝ සිලෝන්?
දයා
ඔව්. ඒ කාලයේදී අද ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ලෙස හඳුන්වන ආයතනය හැඳින්නුවේ රේඩියෝ සිලෝන් නමින්. ලංකා ගුවන් විදුලි සේවය.

ඒ කාලයේ මා තැටිගත කළ ගීත දෙක ප්‍රචාරය වුනා.

ශ්‍රීනාත්
ඔබේ සංගීත කණ්ඩායම පිලිබඳ යමක් කියන්න පුලුවන්ද?
දයා
මම මුලින් කිව්වා වගේ කණ්ඩායම් සංගීතය මේ යුගයේ ජනප්‍රියව තිබුණා. ඉලෙක්ට්‍රොනික සංගීත භාණ්ඩ බහුලව නොතිබුණ ඒ යුගයේ මේ බොහෝ සංගීත කණ්ඩායම් මෙන්ම අපේ කණ්ඩායමත් කැලිප්සෝ සංගීත කන්ඩායමක් ලෙස තමයි ඉදිරියට ආවෙ.

ශ්‍රීනාත්
ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙන්නෙ කොයි කාලෙද?
දයා
1974 දී මට ඕස්ට්‍රේලියාවේ රැකියාවකට ආරාධනාවක් ලැබුණා. නමුත් මම ආවේ 1976 දී. ඒ කාලයේ දැනටත් මම වාසය කරන උතුරු මෙල්බන් ප්‍රදේශයේ සිංහල අය හිටියෙ ඉතාමත් ටික දෙනයි.

ශ්‍රීනාත්
ඔස්ට්‍රේලියාවේ සංගීත ගමන ඇරඹුනේ කොහොමද?
දයා
ලංකාවෙන් ආවෙත් සංගීතය අත් ඇරලා නෙවෙයි. ඒක හදවතේ නිතරම රැඳිලා තිබුණා. මෙහේ හිටිය ටික දෙනත් එක්ක අපි චැපල් ලේන් එකේ තිබුණ කොමියුනිටි හෝල් එකේ එකතු වෙලා කතා බහේ යෙදෙන ගමන් ගීත ගායනා කරන්නත් පටන් ගත්තා. මා ළඟ ගිටාරයක් තිබුණා. ඒ කාලයේ මං වගේම සංගීතයට කැමැත්තක් තිබුණ පොලී වීරක්කොඩි දයාරත්න උඩුවෙල වගේ අය එතන හිටියා. මේ ගායනා එකමුතුව ඉදිරියටම ගියා. ඒ කාලය හරිම විනෝදයි සුන්දරයි. මේ කාලයේ වගේ යාන්ත්‍රික නැහැ.

ශ්‍රීනාත්
අපි අහලා තිබෙනවා මෙල්බන්හි පළමු සිංහල සංගීත කණ්ඩායම ආරම්භ කළේ ඔබයි කියලා.
දයා
ඔව් ඒක වෙන්න පුලුවන්. අපි 1986 දී ඩින්කම් ලන්කන් නමින් සංගීත කණ්ඩායමක් ආරම්භ කළා. මේ කණ්ඩායමට මගේ මල්ලිලා දෙන්නා වන රවි හා ප්‍රියා එක්වුණා. බේස් ගිටාරය වාදනය කළේ දැන් මෙල්බන් කොන්සල් ලෙස කටයුතු කරන බන්දු දිසානායක. මිහිරි දිසානායක තිලකා වෙල්ලාවලගෙ " අයිලීන් රණතුංග චින්තා ගුණතිලක වගේ කීපදෙනෙක්ම අප සමග හිටියා.

**ඔව් ඒක වෙන්න පුලුවන්. අපි 1986 දී ඩින්කම් ලන්කන් නමින් සංගීත කණ්ඩායමක් ආරම්භ කළා. මේ කණ්ඩායමට මගේ මල්ලිලා දෙන්නා වන රවි හා ප්‍රියා එක්වුණා. බේස් ගිටාරය වාදනය කළේ දැන් මෙල්බන් කොන්සල් ලෙස කටයුතු කරන බන්දු දිසානායක. මිහිරි දිසානායක තිලකා වෙල්ලාවලගේ අයිලීන් රණතුංග චින්තා ගුණතිලක වගේ කීපදෙනෙක්ම අප සමග හිටියා.**

ශ්‍රීනාත්
දැන් කාලයත් එක්ක සසඳන කොට ඒ කාලය ගැන ඔබට මොනාද හිතෙන්නෙ?
දයා
ඒ කාලයේ සියලුම දේවල් කර ගත්තෙ අපිමයි. සංගීත කණ්ඩායමේ ශබ්ද විකාශණ පද්ධතිය සකස් කර ගැනීම පවා අපටම කරගන්න සිදුවුණා. ඒ අවස්ථා වලදී සාර්ථ ක හා අසාර්ථක වුණ තැන් තිබෙනවා. නමුත් අද තත්වය බලනකොට එයට වඩා හුගක් වෙනස්. දැන් ඉතා දක්ෂ ශිල්පීන් රැසක් මෙහි ඉන්නවා. තාක්ෂණය අතින් ඉහළ තත්වයක තිබෙනවා. අඩු පහසුකම් යටතේ ආරම්භ කර අපේ ගමන මේ තාක් දුරට ආ එක ගැන සතුටුයි.

ශ්‍රීනාත්
ඔබේ ගීත නිර්මාණ ඉදිරියට ගෙන ගියේ නැද්ද?
දයා
1976 න් පස්සෙ මම සංගත තැටියක් කළේ 1992 දී. ඒ මගේ ප්‍රථම සංගත තැටියයි. ඊට පස්සෙ 1998 දී දෙවෙනි සංගත තැටිය කළා.

ශ්‍රීනාත්
ඉදිරියේදී?
දයා
ඉදිරියේදී නැවත සංගත තැටි කරන්න අදහසක් නැහැ. ඉස්සර නම් සංගී කැසට් පටයක් හෝ තැටියක් හෝ නිවී සැනසිල්ලේ ඉඳගෙන අසා රස විඳීමේ පුරුද්දක් අපේ සමාජයේ තිබුණා. දැන් අන්තර්ජාලය වැනි අලුත් පරිසරයකදි ඒ සියල්ල නැතිවෙලා කියලයි මට හිතෙන්නෙ. ඒ නිසා ගායකයකු ලෙස මගේ නිර්මාණ බිහිකර ඉදිරියට යාමේ අදහසක් දැන් මගේ හිතේ නැහැ. මගේ සතුට බහුතරයක් දෙනා එකවර රසවත් කරන්නට පුලුවන් සංගීත ප්‍රසංග ඉදිරිපත් කිරීමයි.

ශ්‍රීනාත්
ඔබේ "ඩින්කම් ලන්කන්" සංගීත කණ්ඩායම නැවතුනාට පස්සෙ නැවත සංගීත කණ්ඩායමක් බිහි කරන්න හිතුවෙ නැද්ද?

දයා
ඩින්කම් ලන්කන් සංගීත කණ්ඩායම නැවතුණේ අනෙක් සංගීත කණ්ඩායම් වල සිදුවනවා වගේ කිසිම අභ්‍යන්තර ප්‍රශ්ණයක් මත නෙවෙයි. අපි එක් එක් අයට අපේ ජීවිත වල විවිධ කටයුතු වල නිරත වන්න සිදුවුණ නිසයි අපේ සංගීත කණ්ඩායම නැවතුණේ.

දැන් මම "දයා ඇන්ඩ් ද ක්ලෑන්" නමින් සංගීත කණ්ඩායමක් ආරම්භ කර තිබෙනවා. එහි ලීඩ් ගිටාරයෙන් සරත් විජේසුන්දරත් ඩ්‍රම්ස් වාදනයෙන් මාධව මාපාත් මට සහය වෙනවා.

ශ්‍රීනාත්
ඔබ අවුරුදු 40ක් තිස්සේ ආ මේ දිග ගමන පිළිබඳව අපි ඉතා සතුටු වෙනවා. ඉතින් අවුරුදු 40 ක සංගීත දිවිය සමරන්න ඕනෙ නේද අපි?
දයා
ඒ ගැන කියපු එක හොඳයි. මගේ අදහසක් තිබෙනවා මේ අවුරුද්ද අවසාන වන්නට පෙර යමක් කරන්න. ඒ ගැන පුංචි සැළැස්මක් හිතේ තිබෙනවා. ඒකට ඔබ සැමගේම සහය මට අවශ්‍යයි. වෙලාව ආවහම මම ඒ ගැන කියන්නම්.

ඒ එක්කම අපේ රණ විරුවන් වෙනුවෙන් සැළසුම් කර ඇති නිවාස යෝජනා ක්‍රමය සඳහා ආධාර පිනිස දැවැන්ත ප්‍රසංගයක් කරන්නත් සැළසුමක් තිබෙනවා.

අවුරුදු 40 ක් යනු ඉතා දිගු කාලයකි. ඒ සා කාලයක් සිය දිවිය සංගීත වෙනුවෙන් කැප කළ දයා සිල්වා සංගීතවේදියාගේ ගමනට සන්නස වෙනුවෙන් ආසිරි පතන්නෙමු.